අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
"இசுருபாய", பத்தரமுல்ல, இலங்கை.
"Isurupaya", Battaramulla, Sri Lanka
+94112785141-50 · +94112784846
isurupaya@moe.gov.lk · www.moe.gov.lk

මගේ අංකය / எனது இல / My Ref: ED/12/01/01/පොදු
ඔබේ අංකය / உமது இல / Your Ref:
දිනය / திகதி / Date: 2023.03.27

සියළුම විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,

සියළුම ජාතික පාසල් විදුහල්පතිවරුන්,

ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,

<u>මැතිවරණ කාලසීමාව තුළ අනධ්‍යයන කාර්යමණ්ඩල ස්ථාන මාරුවීම</u>

මැතිවරණ කොමිෂන් සභා ලේකම්ගේ අංක : EC/SO/LAE/2023/4C(II) හා 2023.03.13 දිනැති ලිපිය හා බැඳේ.

02. පළාත් පාලන ඡන්ද විමසීමක් ප්‍රකාශ කර ඇති මෙම කාලපරිච්ඡේදය තුළ, වාර්षික නොවන ස්ථාන මාරුවීම් හා අනුයුක්ත කිරීම් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ එකඟත්වය ලබා ගත යුතු වේ.

03. එසේ එකඟත්වය ලබා ගැනීමේදී අදාළ නිලධාරීන්ගේ ඉල්ලීම් සෘජුව මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති බවත් , එම ඉල්ලීම් පෞද්ගලිකව ඒ ඒ තනතුරුධාරීන් විසින් ඉදිරිපත් කිරීම හැර, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කිසිදු නිර්දේශයක් හෝ අවම වශයෙන් ලිපියක් ඉදිරිපත් කිරීමක් පවා නොකිරීම කණගාටුදායක තත්ත්වයක් බවත් උක්ත ලිපිය මගින් මැතිවරණ කොමිෂන් සභාවේ ලේකම් විසින් මා වෙත දන්වා ඇත.

04. ඒ අනුව ස්ථාන මාරුවීම් හෝ අනුයුක්ත කිරීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දී අදාළ නිලධාරියාගේ පෞද්ගලික අභියාචනය ද සමග මෙහි දක්වා ඇති ආකෘතිය අනුව තොරතුරු සම්පූර්ණ කර, ආයතන ප්‍රධානියා මඟින් මා වෙත යොමු කරන ලෙස ඔබ යටතේ සේවය කරන සියළුම අනධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

ආර්.බී. ගන්කේවල
අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා)
අධ්‍යාපන ලේකම් වෙනුවට

පිටපත: ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

Scanned with MOBILE SCANNER